**සබරගමු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සති පාසල් වැඩසටහන**
**10 ශ්‍රේණිය**
**නොවැම්බර් 4වන සතිය**

## ඊජිප්තු චිත්‍ර නිර්මාණ

ඊජිප්තු චිත්‍ර නිර්මාණ සොහොන් ගෙවල් වන පිරමීඩ හා දේවස්ථාන තුළද දැකිය හැකිය. ද්විමාන බව හා පාර්ශවගත බව මෙම චිත්‍රවල දැකිය හැකි විශේෂ ලක්ෂණයයි. වර්ණ යෙදීමේදී බොහෝවිට පැතලි ක්‍රමයට වර්ණ යොදා ඇත. කල්පිත සංකල්ප මෙන්ම ජන ජීවිතයේ විවිධ සිද්ධි, රජවරුන් බිසෝවරුන් සම්බන්ධ සිද්ධිද සිතුවම් සඳහා තේමාකොටගෙන තිබේ. ඊජිප්තු සිතුවම් අතර සටහන් කර ඇති හයිරොග්ලිපික්ස් හෙවත් රූපාක්ෂර ලේඛනකරණයේ පළමු අවස්ථාව ලෙසින් අදටත් පුරාවිද්‍යාඥයින්ගේ ගවේෂණයට ලක්වේ.

### 1.මීඩම් හි පාත්තයෝ ( Gees of Meduim )



- මෙම සිතුවම ක්‍රි.පූ 2630 ඊජිප්තු පැරණි රාජධානි යුගයට අයත් නිර්මාණයකි.
- මීඩම් හි මස්ටාබා වර්ගයට අයත් සොහොන් ගෙයකින් හමුවී ඇති මෙම සිතුවමෙන් නිරූපණය වන්නේ එකා පසුපස එකා ගමන් කරන පාත්තයන් සමූහයකි.
- මෙහි පාත්තයන් හයදෙනා තිදෙනා බැගින් දෙපැත්තට එකා පසුපස ගමන් කරන ආකාරයක් පෙන්වයි.
- තලය මත රූප සම්පිණ්ඩනය කිරීමේදී ඉදිරියෙන් සිටින පාත්තයාගේ හිස බිමට නැඹුරු කරගත් අයුරෙන් ඇඳ ඇති අතර ක්‍රියාකාරී බවක්ද සතුන්ගේ ඉරියව් ක්‍රමිකව දැක්වීමටද ශිල්පියා සමත්වී ඇත.
- වර්ණ යෙදීමේදී කළු, සුදු, දුඹුරු වර්ණ වල විවිධ ප්‍රභේද මතුවන ලෙස යොදා ඇති අතර රේඛාව මගින් සියුම් ලෙස විස්තරාත්මක හැඩ දක්වා ඇත. මෙම ලක්ෂණ ඊජිප්තු මානව රූප සඳහා යොදාගෙන නොමැති අතර එය ස්වභාවික ලක්ෂණ සඳහා වර්ණ හා රේඛාව මගින් ත්‍රිමාණ ලක්ෂණ මතුකිරීමක් ලෙස හඳුනාගත හැකිය.

**ඉහත කරුණු ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1. මෙම සිතුවම අයත් යුගය හා කාලය නම් කරන්න

2. මෙම සිතුවම හමුවී ඇති ස්ථානය කුමක්ද?

3. මෙම සිතුවමෙන් නිරූපණය වන්නේ කුමක්ද?

4. සිතුවම වර්ණ කිරීම සඳහා භාවිත කර ඇති වර්ණ මොනවාද?

5. ඊජිප්තු මානව රූප සිතුවම් සඳහා අනුගමනය නොකළ එහෙත් මෙම සිතුවමේ දක්නට ඇති විශේෂ ලක්ෂණය කුමක්ද?

## 2. කුරුලු දඩයම ( **Fowling Scene** )



- මෙම සිතුවම ක්‍රි.පූ 1580 ත් 1350 ත් අතර කාලයේ නව රාජධානි යුගයට අයත් යැයි සැළකේ.
- මෙය තීබ්ස්හි නෙබාමුන් සොහොන් ගැබෙන් හමුවී ඇති වර්ණ සිතුවමකි.
- සිතුවමෙන් දැක්වෙන්නේ ඊජිප්තු වංශාධිපතියෙක් වූ නෙබාමුන් නයිල් නදියේ ඔරුවක නැගී අතැති භූමරංගයෙන් කුරුල්ලන් දඩයම් කරන ආකාරයයි. ඔහුගේ එක් අතක අල්ලාගත් පක්ෂීන් තිදෙනෙකි. සිතුවමේ දැක්වෙන කාන්තා රූප ඔහුගේ දියණිය හා භාර්යාව ලෙසට අදහස් කෙරේ.
- පැපිරස් පඳුරු අතර පක්ෂීන් දැක්වෙන අතර ඒ අසළ වූ දඩයම් බළලා පාදවලින් හා කටින් පක්ෂීන් අල්ලාගෙන සිටින ආකාරය දක්වා ඇත.
- මානව රූප ශෛලිගත හා පාර්ශවදර්ශී ස්වරූපයෙන් ද සතුන් හා ශාක පත්‍ර ඉතා ස්වභාවිකවද සිතුවම් කර තිබේ.
- තීරු චිත්‍ර සංරචනයක් වන මෙම චිත්‍ර රාමුව සිද්ධි ගණනාවක එකතුවකින් යුක්ත වන අතර එමගින් චිත්‍රයේ ක්‍රියාකාරී බව නිරූපණය කරවයි.
- මෙය වියළි බදාමයක් මත වන ප්‍රෙස්කෝ සිකෝ ශිල්ප ක්‍රමයට අඳින ලද බිතු සිතුවමකි.
- රූප වර්ණ ගැන්වීම සඳහා අඳුරු කහ, රතු, සුදු, කළු ආදී වර්ණ භාවිත කර ඇති අතර මෙම වර්ණ ද්විමාන ලක්ෂණ සහිතය.
- චිත්‍රයේ පසුබිමේ හයිරොග්ලිපික්ස් හෙවත් රූපාක්ෂර දැකිය හැකිය.
- දැනට මෙය ලන්ඩනයේ බ්‍රිතාන්‍ය කෞතුකාගාරයේ තැන්පත් කර ඇත.

**ඉහත කරුණු ඇසුරෙන් පහත දැක්වෙන ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

1. මෙම චිත්‍රය ඊජිප්තුවේ කිනම් යුගයකට අයත් වේද?

2. මෙම සිතුවම හමුවන ස්ථානය කුමක්ද?

3. මෙම සිතුවමෙන් කුමන අවස්ථාවක් නිරූපණය වේද?

4. මෙම සිතුවමෙහි වංශාධිපතියාගේ අතෙහි යමක් දක්නට ඇති අතර එය කුමක්ද?

5. මෙහි මානවරූප සිතුවම් කර ඇති ශෛලිය කුමක්ද?

6. මෙම සිතුවමේ සතුන් හා ශාක චිත්‍රණය කර ඇත්තේ කිනම් ශෛලියකටද?

7. මෙහි ශිල්ප ක්‍රමය කුමක්ද?

8. චිත්‍රයේ පසුබිමේ දැක්වෙන මිසර රූපාක්ෂර කුමන නමකින් හැඳින්වේද?

9. රූප වර්ණ ගැන්වීමේදී දක්නට ඇති විශේෂත්වය කුමක්ද?

10. දැනට මෙය තැන්පත් කර ඇති ස්ථානය කුමක්ද?